(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 38.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 නොවැම්බර් මස 03 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0640/'09

1.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරේ පැවති යුද වාතාවරණය හේතුවෙන් අනුරාධපුරයෙන් ඉදිරියට දුම්රිය ධාවනය කළ හැකිව තිබුණේ කවර දුම්රිය ස්ථානයක් දක්වාද;

(ii) යුද්ධය අවසන්වීමෙන් පසුව වවුනියාවෙන් ඉදිරියට දුම්රිය ධාවනය කළේ නම් ඒ කෙදිනක, කවර දුම්රිය ස්ථානයක් දක්වාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වවුනියාවෙන් ඉදිරියට දුම්රිය ධාවනය ආරම්භ කිරීමේ උත්සවයක් පැවැත්වූයේද;

(ii) එසේ නම්, ඒ කවදා ද;

(iii) අනතුරුව, එම මාර්ගවල එක් එක් මාසයේ එම දිනයන් තුළ කොපමණ වාර ගණනක් දුම්රිය ධාවනය කරන ලද්දේ ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) උතුරට දුම්රිය ධාවනය ආරම්භ කළද, මගී ජනතාවගේ ගමනාගමන අවශ්‍යතාවය සපුරාලීමට මෙම ගමන් වාර සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0660/'09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලුනාව සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රදේශවාසීන් මුහුණ පෑ ගැටලු පිළිබඳව සොයා බැලීම සඳහා වූ "සඳසිරි වික්‍රමාරච්චි ඒක පුද්ගල කමිටුව" පත්කළ දිනය කවරේද;

(ii) උක්ත කමිටුව විසින් ඉදිරිපත් කළ වාර්තාවේ සාරාංශය කවරේද;

(iii) එකී වාර්තාව ඉදිරිපත් කළ දිනය කවරේද;

(iv) අදාළ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් කරන ලද අවස්ථා තිබේද;

(v) මෙතෙක් පාර්ලිමේන්තුවට එම වාර්තාව ඉදිරිපත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0699/'09

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යටතේ ස්ථාපනය කර ඇති "මග නැගුම" ව්‍යාපෘතිය මගින් 2008 වර්ෂයේ සහ 2009 වර්ෂයේ මේ දක්වා ඉදිකර ඇති මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මාර්ගය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එකී ඇස්තමේන්තුගත මුදලින් මේ දක්වා වැයකර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කර ඇති මහාමාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම යටතේ දිවයින පුරා විවෘත කර ඇති කාර්යාල සංඛ්‍යාව සහ රථවාහන අංගන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0700/'09

4.

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) නැගෙනහිර පළාතේ නීතිමය අවසරයක් නොමැතිව ආයුධ දරන පුද්ගලයින් සිටින්නෙහිද;

(ii) සිවිල් ආරක්ෂක බලකාය, පොලිසිය හා ත්‍රිවිධ හමුදාව හැර වෙනත් අයට ආයුධ දැරීමට අවසර දී තිබේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම සංඛ්‍යාව හා එම අය නිරායුධ කිරීමට රජය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0715/'09

5.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) 2009 මැයි මස 19 දිනට පෙර තම තනතුරු හැරයාම හේතුවෙන් බන්ධනාගාරගතවී සිටින සන්නද්ධ හමුදා භටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් නිදහස් කරවා ගැනීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද;

(iii) විශ්‍රාම වැටුප් ලැබීමට ප්‍රමාණවත් කාලසීමාවක් ඔවුන් සේවය කර ඇත්නම් ඔවුන්ට විශ්‍රාම අයිතිය හිමිවන්නේද;

(iv) නොඑසේ නම්, ඔවුන්ට ආපසු හමුදාවලට පැමිණීමට සහාය ලබාදිය හැක්කේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0729/'09

6.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආරුක්කු බෝක්කුවක් කඩා වැටීම පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අධිවේගී මාර්ගයේ ආරුක්කු බෝක්කු කොපමණ සංඛ්‍යාවක් ඉදිකර තිබේද;

(ii) මෙම නිර්මාණ සැලසුම් කරන ලද ආයතනයේ හෝ සමාගමේ නම කවරේද;

(iii) මෙම ඉදිකිරීම් දේශීය ඉංජිනේරු සමාගම් යටතේ නිරීක්ෂණය කර තිබේද;

(iv) එසේ නොකළේ නම්, ඊට හේතු කවරේද;

(v) එම සැලසුම්, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය මගින් අනුමතකර තිබුණේද;

(vi) අදාළ ඉදිකිරීම් සඳහා ගෙවූ මුදල කොපමණද;

(vii) එම වැය කළ ජාතික ධනය ආපසු ලබා ගැනීමට කවර පියවරක් ගන්නේද;

(viii) ඉදිකිරීම් කටයුතු අවසන්ව ඇති පාලම් කොපමණ සංඛ්‍යාවක් ඉවත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත ඉවත් කිරීමට පියවර ගන්නා පාලම් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු භාරදී ඇත්තේ දේශීය සමාගමකටද, නොඑසේ නම්, විදේශීය සමාගමකටද;

(ii) ඒ සඳහා ගන්නා ලද ණය ප්‍රමාණය හා අදාළ පොලිය ද ඇතුළත්ව ගෙවිය යුතු මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0775/'09

7.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා මෙම අමාත්‍යාංශයට අයවැයෙන් වෙන් කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් ප්‍රමාණය ප්‍රාග්ධන හා පුනරාවර්තන වශයෙන් වෙන් වෙන්ව කොපමණද;

(iii) ඒ ඒ වර්ෂයේ වෙන්කරන ලද මුදල හා ලැබුණ මුදල අතර වෙනසක් තිබේද;

(iv) එසේනම්, වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් ඒ කොපමණ ප්‍රමාණයක්ද,

(v) එසේ මුදල් අඩුවී ඇත්නම් ඊට හේතු කවරේද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන ආයතන සංඛ්‍යාව හා වෙන් වෙන් වශයෙන් ඒවා කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0641/'09

8\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි හිඟුරක්ගොඩ රජයේ බිත්තර වී නිෂ්පාදන ගොවිපොළ කෙදිනක ආරම්භ කරන ලද්දේද;

(ii) එය කවර අරමුණක් ඇතිව ස්ථාපනය කරන ලද්දේද;

(iii) මෙම ගොවිපොළ බදු දෙනු හෝ විකුණනු ලැබුවේ නම්, ඒ කවදාද;

(iv) ඒ කවර ආයතනයකටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගොවිපොළ බදු හෝ කුලී පදනමින් ලබා දී තිබේ නම්, එසේ දී ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(ii) බදු දුන් වර්ෂයේ සිට එක් එක් වර්ෂයේදී රජයට ගෙවා ඇති බදු මුදල කොපමණද;

(iii) 2008 වර්ෂයේ මෙම ගොවිපොළෙන් එක් හෙක්ටයාරයකට ලැබුණු බදු ආදායම කොපමණද;

(iv) මෙය පවරා දෙන අවස්ථාවේ කොපමණ චංචල හා නිශ්චල දේපළ ප්‍රමාණයක් තිබුණේද;

(v) එම දේපළ කවර කාර්යයකට යොදවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ප්‍රමාණවත් බිත්තර වී ඇතුළු බීජ සැපයීමට ස්ථාපනය කළ මෙම ගොවිපොළ අහිමි වීමෙන් ගොවීන්ට අසාධාරණයක් සිදු වී ඇති බැවින්, මෙය නිවැරදි කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0695/'09

9\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 අගෝස්තු මස 30 දා පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, 1980 ජුලි වැඩ වර්ජනය සඳහා සහභාගි වූ පේෂකර්මාන්ත අංශයේ සේවකයන් සඳහා හිඟ වැටුප් ගෙවීමට තීරණයක් ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වසර 30කට ආසන්න කාලයක් ගතවී ඇති උක්ත විශ්‍රාමික සේවකයන්ගේ හිඟ වැටුප් ගෙවීමට කටයුතු නොකිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0701/'09

10\.

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිඟුරාණ සීනි ආයතනය නැවත රජයට පවරා ගත්තේ කවදාද;

(ii) පෞද්ගලීකරණය නිසා රජය ලැබූ සමස්ත පාඩුව කොපමණද;

(iii) එතැන් සිට ආයතනයේ උක් ඇඹරීම නතර කොට කොපමණ කාලයක් ගතවී තිබේද;

(iv) යළි සමාගමක් බවට පත්කරනතෙක් නඩත්තු සහ පරිපාලන කටයුතු සඳහා මාසිකව වැයකළ මුදල කොපමණද;

(v) මෙම ආයතනය යළි පැවරුවේ කාහටද, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) හිඟුරාණ සීනි ආයතනය යළි පැවරීමේදී ඊට ගිවිසුමක් අත්සන් කළේ නම් අදාළ ගිවිසුම එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට වගාකර ඇති ඉඩම් ප්‍රමාණය හා උක් ටොන් එකකට ගෙවන මිල කොපමණද;

(ii) ආයතනයේ සේවය කළ සහ දැනට සේවය කරන, දුෂ්කර දීමනාව ලැබියයුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට අදාළ මුදල ගෙවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) පෞද්ගලීකරණයේදී 10% කොටස් මුදල ලැබීමට හිමිකම් ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සියලු අයට හිමි සමස්ත මුදල කොපමණද;

(iii) එය කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0716/'09

11.

ගරු රවි කරුණානායක මහතා,—ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ අරමුදල් පරිපාලනය කරමින් සිටින අයගේ නම් කවරේද;

(ii) මේ අවස්ථාව වන විට පවතින මුදල් තත්ත්වය සහ පසුගිය වසර 05 සඳහා වූ මුදල් තත්ත්වය වාර්ෂික පදනමින් කවරේද;

(iii) පසුගිය වසර 10 තුළ ක්‍රිකට් පාලක මණ්ඩලයට අරමුදල් ලැබුණ මූලාශ්‍ර වාර්ෂික පදනමින් කවරේද;

(iv) අපට ආදායම් ලැබීමට ඉවහල් වන සියලුම ප්‍රදානයන් ටෙන්ඩර් මණ්ඩලයක් මගින් තීරණය කරන්නේද;

(v) එසේ නොමැතිනම් ඒ සඳහා සාධාරණව යොදා ගන්නා ක්‍රමය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වසර 06 සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ විගණනය කරන ලද ගිණුම් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ක්‍රිකට් ක්‍රීඩකයන්ට සහ සංචිතයේ සිටින ක්‍රීඩකයන්ට ගෙවනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඔවුන්ගේ ඉපැයීම් බදුවලින් නිදහස් කර තිබේද;

(iii) නොඑසේ නම්, බදු යෙදවුම් ප්‍රමාණය කවරේද;

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය තුළ සිටින, මණ්ඩලය විසින් වැඩිම වියදමක් දරනු ලබන නිලධාරීන් 20 දෙනාගේ නම් කවරේද;

(v) ඔවුන්ගේ මාසික වාර්ෂික ඉපැයීම් පසුගිය වසර 05 සඳහා වෙන් වෙන් වශයෙන් වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0738/'09

12.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009-08-09 දින බෝම්බ සවිකරන ලද වෑන් රථයක් මන්නාරම් නගරයේ දී අත්අඩංගුවට ගත්තේද;

(ii) එම බෝම්බයේ බර කොපමණද;

(iii) අත්අඩංගුවට ගත් 54-6293 දරන වෑන් රථයේ අයිතිකරු කවුරුන්ද;

(iv) දැනට එම අය පොලිස් අත්අඩංගුවේ සිටීද, නොඑසේනම් නිදහස්කර තිබේද;

(v) නිදහස්කර තිබේනම් ඒ කවර පදනමක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අත්අඩංගුවට ගැනීම සිදු කළ පොලිස් නිලධාරියා කවුරුන්ද;

(ii) නම සඳහන් නොකරන්නේනම් එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අදාළ කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා මෙවැනි බෝම්බ සහිත වාහනයක් අත්අඩංගුවට නොගත් බවට ප්‍රකාශ කරන බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, එහි පදනම කවරේද;

(ii) මෙම බෝම්බය, බෝම්බ නිෂ්ක්‍රීය අංශය වෙත යොමු කළේද;

(iii) එලෙස යොමු නොකර කොළඹට ගෙන ආයේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) මේ සම්බන්ධව සම්පූර්ණ වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0776/'09

13.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006, 2007, 2008 හා 2009 යන වර්ෂ සඳහා මෙම අමාත්‍යාංශයට අයවැයෙන් වෙන් කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් ප්‍රමාණය ප්‍රාග්ධන හා පුනරාවර්තන වශයෙන් වෙන් වෙන් ව කොපමණද;

(iii) ඒ ඒ වර්ෂයේ වෙන්කරන ලද මුදල හා ලැබුණ මුදල අතර වෙනසක් තිබේද;

(iv) එසේ නම්, වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(v) එසේ මුදල් අඩුවී ඇත්නම් ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන ආයතන සංඛ්‍යාව හා වෙන් වෙන් වශයෙන් ඒවා කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0642/'09

14\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරේ පැවතුන යුද වාතාවරණය හේතුවෙන් කොපමණ පිරිසක් අවතැන් කඳවුරුවල ජීවත් වන්නේද;

(ii) අදාළ සුභසාධන මධ්‍යස්ථාන ආරම්භ කළ දින සිට මේ දක්වා එම කඳවුරු තුළ සිදු වූ ස්වභාවික මරණ සංඛ්‍යාව කොපමණද;

(iii) එය රටේ සාමාන්‍ය මරණ අනුපාතයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මරණයට පත්වන්නන්ගේ අවසාන කටයුතු ඔවුන්ගේ සංස්කෘතියට, ආගමට අනුව සිදු කිරීමට අවකාශ සලසා තිබේද;

(ii) එවැනි වැඩපිළිවෙළක් තිබේනම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0702/'09

15\.

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කය තුළ ඇති සියලුම පාසල් සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල මේ වනවිට සිටින ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කය තුළ මේ වනවිට ඇති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව ඒ ඒ විෂයයන් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0708/'09

16\.

ගරු රවි කරුණානායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වසර පහක කාලය තුළ,

(i) මෙරටට ආනයනය කරන ලද, දේශීයව වගා කරනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන වර්ග දහයක නම් කවරේද;

(ii) එම එක් එක් නිෂ්පාදනයෙන් කොපමණ ප්‍රමාණයක් වාර්ෂිකව ආනයනය කරනු ලැබුවේද;

(iii) රට තුළ වගා කරනු ලබන ප්‍රමාණයද ඇතුළුව එම නිෂ්පාදනවල දේශීය පරිභෝජනය කොපමණද;

(iv) මෙම නිෂ්පාදන මත පනවා ඇති බදු ප්‍රමාණය කොපමණද;

(v) දේශීයව එම නිෂ්පාදන වැඩි වශයෙන් වගා නොකිරීමට හේතුව කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට පොහොර සහනාධාරය ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එක් එක් නිෂ්පාදනය සඳහා එක් එක් වර්ෂයේදී ලබා දී ඇති පොහොර ටොන් ප්‍රමාණය කොපමණද;

(iii) මේ වන විට වගා කිරීම සඳහා දිරිමත් කරනු ලබන්නාවූ වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන පහක් මොනවාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන (සංශෝධන),— 2008 අංක 43 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යතුමා,— වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන),—2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2009 නොවැම්බර් මස 03 වැනි අඟහරුවාදා, 04 වැනි බදාදා සහ 05 වැනි බ්‍රහස්පතින්දා රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 5.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතුය.

4.

ගරු (පූජ්‍ය) අක්මීමණ දයාරතන හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1) — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"හෙළ උදාව ජාතික ව්‍යාපාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2) — පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"ශ්‍රී ලංකා විශ්ලේෂණ රසායනාගාර සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

6.

ගරු අන්ජාන් උම්මා මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3)— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

"පුරාවස්තු සුරැකීමේ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අතුරු සම්මත ගිණුම 2010),—

2010 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භ වී, 2010 දෙසැම්බර් මස 31 දිනයෙන් අවසාන වන්නා වූ, 2010 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා ප්‍රතිපාදන සැලසෙන විසර්ජන පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී,—

(අ) (2008 අංක 43 දරන විසර්ජන පනතින් හා පරිපූරක ඇස්තමේන්තු මඟින් වියදම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබූ සේවාවන් වන) මෙම යෝජනාවේ පළමුවන උපලේඛනයේ නියමිත සේවාවන් සඳහා රුපියල් තිස්පන් දහස් හයසිය හතලිස් හය කෝටි පනස් පන් ලක්ෂ හත් දහසක (රු. 35,646,55,07,000) ට නොවැඩි මුදලක්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු යැයි ද, එකී මුදල ඒ උපලේඛනයෙහි සඳහන් ආකාරයට එකී කාලසීමාව තුළදී වැය කරනු ලැබිය හැකි බව ද ; සහ

(ආ) එකී කාලසීමාව තුළදී, මෙම යෝජනාවේ දෙවන උපලේඛනයෙහි I වන තීරයේ සඳහන් සේවාවන් සඳහා රුපියල් හයසිය විසි දෙකෝටි විසි හතර ලක්ෂ හැට හත් දහසක (රු. 622,24,67,000) මුළු මුදලකට නොවැඩි මුදලක්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් දෙනු ලබන අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි ද, එම කාලසීමාව තුළදී එකී සේවාවන් වෙනුවෙන් දරනු ලබන වියදම ඒ උපලේඛනයෙහි II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් උපරිම සීමා නොඉක්මවිය යුතු යැයි ද ;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය ප්‍රකාරව මෙම පාර්ලිමේන්තුව මෙයින් යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

**පළමුවැනි උපලේඛණය**

**පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්**

| ශීර්ෂ අංකය | | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|---|
| ශීර්ෂ | 1 | අතිගරු ජනාධිපති | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 912,104,000 | 388,216,000 |
| | | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 1,000,000,000 |
| ශීර්ෂ | 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 52,250,000 | 13,166,000 |

| ශීර්ෂ අංකය | | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|---|
| ශීර්ෂ | 3 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 15,521,000 | |
| ශීර්ෂ | 4 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 11,290,000 | 3,466,000 |
| ශීර්ෂ | 5 | පාර්ලිමේන්තුව | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 449,096,000 | 50,000,000 |
| ශීර්ෂ | 6 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 6,426,000 | 550,000 |
| ශීර්ෂ | 7 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 7,885,000 | 366,000 |
| ශීර්ෂ | 8 | පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලය | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 17,326,000 | 466,000 |
| ශීර්ෂ | 11 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 3,739,000 | 66,000 |
| ශීර්ෂ | 12 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 38,223,000 | 1,446,000 |
| ශීර්ෂ | 13 | අධිකරණ සේවා කොමිෂන් සභාව | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 11,125,000 | 766,000 |
| ශීර්ෂ | 14 | ජාතික පොලිස් කොමිෂන් සභාව | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 15,875,000 | 433,000 |
| ශීර්ෂ | 15 | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 3,908,000 | 91,000 |
| ශීර්ෂ | 16 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 39,998,000 | 18,716,000 |
| ශීර්ෂ | 17 | මැතිවරණ දෙපාර්තමේන්තුව | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 356,196,000 | 10,100,000 |
| ශීර්ෂ | 18 | විගණකාධිපති | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 167,025,000 | 77,666,000 |
| ශීර්ෂ | 19 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය | | | |
| | | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 1,940,000 | 66,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 20 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 11,016,000 | 21,811,000 |
| ශීර්ෂ 21 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 7,870,000 | 1,853,000 |
| ශීර්ෂ 22 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 33,833,000 | 766,000 |
| ශීර්ෂ 101 | ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 23,412,000 | 101,905,000 |
| ශීර්ෂ 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 8,485,000 | 31,926,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 124,885,000 | |
| ශීර්ෂ 202 | මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 11,821,000 | 26,891,000 |
| ශීර්ෂ 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 18,388,000 | 4,613,000 |
| ශීර්ෂ 204 | හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 18,665,000 | 21,868,000 |
| ශීර්ෂ 205 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 9,958,000 | 346,000 |
| ශීර්ෂ 102 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 349,938,000 | 7,708,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 258,666,000 |
| ශීර්ෂ 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 25,058,000 | 33,943,000 |
| ශීර්ෂ 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 712,922,000 | 1,058,000 |
| ශීර්ෂ 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 51,501,000 | 5,883,000 |
| ශීර්ෂ 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 20,364,000 | 14,933,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 7,241,666,000 | 9,649,166,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 11,531,000 | 2,400,000 |
| ශීර්ෂ 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 8,910,000 | 598,000 |
| ශීර්ෂ 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 200,538,000 | 133,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 733,333,000 |
| ශීර්ෂ 244 | වෙළෙඳ, තීරුබදු සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 206,739,000 | 106,000 |
| ශීර්ෂ 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 21,576,000 | 950,000 |
| ශීර්ෂ 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 482,946,000 | 223,566,000 |
| ශීර්ෂ 247 | ශ්‍රී ලංකා රේගුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 539,483,000 | 516,666,000 |
| ශීර්ෂ 248 | සුරාබදු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 118,574,000 | 23,833,000 |
| ශීර්ෂ 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 1,742,555,000 | 412,216,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 4,822,266,000 |
| ශීර්ෂ 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 8,535,000 | 616,000 |
| ශීර්ෂ 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 58,266,000 | 16,283,000 |
| ශීර්ෂ 252 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 173,500,000 | 111,600,000 |
| ශීර්ෂ 296 | ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 11,820,000 | 550,000 |
| ශීර්ෂ 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 1,537,000 | 350,000 |
| ශීර්ෂ 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 7,186,000 | 466,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 103 | රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 702,713,000 | 1,406,466,000 |
| ශීර්ෂ 222 | ශ්‍රී ලංකා යුද හමුදාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 32,414,333,000 | 2,131,333,000 |
| ශීර්ෂ 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 9,514,000,000 | 2,086,666,000 |
| ශීර්ෂ 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 6,091,666,000 | 1,725,000,000 |
| ශීර්ෂ 225 | පොලිස් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 11,479,766,000 | 922,000,000 |
| ශීර්ෂ 320 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 2,854,333,000 | 124,000,000 |
| ශීර්ෂ 325 | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 13,450,000 | 3,150,000 |
| ශීර්ෂ 104 | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 37,741,000 | 3,708,000 |
| ශීර්ෂ 280 | විදේශාධාර හා අයවැය අධීක්ෂණ දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 16,823,000 | 6,683,000 |
| ශීර්ෂ 105 | ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 9,751,000 | 733,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 2,944,312,000 | 15,723,087,000 |
| ශීර්ෂ 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 3,893,716,000 | 1,066,000 |
| ශීර්ෂ 305 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 4,579,000 | 300,000 |
| ශීර්ෂ 106 | ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 31,678,000 | 26,000,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 39,300,000 | 445,520,000 |
| ශීර්ෂ 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 49,930,000 | 74,400,000 |
| ශීර්ෂ 107 | සංචාරක අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 33,976,000 | 1,874,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 601,000,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 108 | තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 27,211,000 | 4,317,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 6,666,000 | 25,000,000 |
| ශීර්ෂ 308 | තැපැල් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 2,240,333,000 | 51,363,000 |
| ශීර්ෂ 110 | අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 109,092,000 | 70,633,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 16,700,000 |
| ශීර්ෂ 228 | අධිකරණ පරිපාලනය | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 834,723,000 | 339,136,000 |
| ශීර්ෂ 229 | නීතිපති දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 126,970,000 | 11,166,000 |
| ශීර්ෂ 230 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 15,336,000 | 22,166,000 |
| ශීර්ෂ 231 | ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 1,935,000 | 58,000 |
| ශීර්ෂ 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 943,900,000 | 92,733,000 |
| ශීර්ෂ 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 23,048,000 | 85,566,000 |
| ශීර්ෂ 234 | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 23,702,000 | 3,616,000 |
| ශීර්ෂ 235 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 3,655,000 | 1,266,000 |
| ශීර්ෂ 111 | සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 13,032,982,000 | 340,070,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 1,630,639,000 | 4,662,940,000 |
| ශීර්ෂ 112 | විදේශ කටයුතු අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 39,047,000 | 2,751,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 1,566,240,000 | 266,000,000 |
| ශීර්ෂ 113 | වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 85,330,000 | 3,140,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 12,248,929,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 114 | ප්‍රවාහන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 41,210,000 | 23,533,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 1,358,333,000 | 1,323,083,000 |
| ශීර්ෂ 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 3,130,731,000 | 3,146,333,000 |
| ශීර්ෂ 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 237,009,000 | 427,166,000 |
| ශීර්ෂ 115 | ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 45,360,000 | 101,870,000 |
| ශීර්ෂ 116 | වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 163,313,000 | 311,804,000 |
| ශීර්ෂ 297 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 8,183,000 | |
| ශීර්ෂ 298 | මිණුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 16,625,000 | 34,000,000 |
| ශීර්ෂ 299 | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 4,786,000 | |
| ශීර්ෂ 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 27,128,000 | 8,925,000 |
| ශීර්ෂ 301 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්) | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 13,450,000 | 1,940,000 |
| ශීර්ෂ 302 | සමූපකාර සේවක කොමිෂන් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 3,008,000 | 81,000 |
| ශීර්ෂ 117 | මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 41,294,000 | 4,741,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 29,210,466,000 |
| ශීර්ෂ 118 | කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 85,901,000 | 6,983,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 9,143,208,000 | 3,432,695,000 |
| ශීර්ෂ 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 53,936,000 | 12,833,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 799,733,000 | 81,833,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 64,693,000 | 5,916,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 469,446,000 | 125,766,000 |
| ශීර්ෂ 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 77,019,000 | 112,266,000 |
| ශීර්ෂ 119 | විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 545,310,000 | 118,458,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 12,816,666,000 |
| ශීර්ෂ 120 | ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 66,946,000 | 44,183,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 214,975,000 | 33,203,000 |
| ශීර්ෂ 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 3,998,000 | 275,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 43,015,000 | 2,408,000 |
| ශීර්ෂ 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 154,766,000 | 262,333,000 |
| ශීර්ෂ 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 26,958,533,000 | 5,450,000 |
| ශීර්ෂ 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 149,625,000 | 35,733,000 |
| ශීර්ෂ 255 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 120,056,000 | 53,858,000 |
| ශීර්ෂ 256 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 163,641,000 | 12,133,000 |
| ශීර්ෂ 257 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 134,136,000 | 10,133,000 |
| ශීර්ෂ 258 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 182,721,000 | 20,566,000 |
| ශීර්ෂ 259 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 95,691,000 | 14,166,000 |
| ශීර්ෂ 260 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 71,750,000 | 66,508,000 |
| ශීර්ෂ 261 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 163,175,000 | 18,466,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 262 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 129,791,000 | 15,883,000 |
| ශීර්ෂ 263 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 102,971,000 | 18,600,000 |
| ශීර්ෂ 264 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය- යාපනය | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 85,933,000 | 13,983,000 |
| ශීර්ෂ 265 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය- මන්නාරම | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 24,321,000 | 12,516,000 |
| ශීර්ෂ 266 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය- වවුනියාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 28,895,000 | 9,700,000 |
| ශීර්ෂ 267 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය /කච්චේරිය- මුලතිව් | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 21,983,000 | 5,466,000 |
| ශීර්ෂ 268 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය- කිලිනොච්චි | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 23,808,000 | 7,983,000 |
| ශීර්ෂ 269 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය- මඩකලපුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 80,160,000 | 14,983,000 |
| ශීර්ෂ 270 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 134,896,000 | 35,066,000 |
| ශීර්ෂ 271 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - ත්‍රිකුණාමලය | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 53,625,000 | 10,783,000 |
| ශීර්ෂ 272 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 254,488,000 | 27,050,000 |
| ශීර්ෂ 273 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 105,283,000 | 25,100,000 |
| ශීර්ෂ 274 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 130,691,000 | 16,050,000 |
| ශීර්ෂ 275 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 61,075,000 | 16,866,000 |
| ශීර්ෂ 276 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 108,408,000 | 41,183,000 |
| ශීර්ෂ 277 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 73,933,000 | 54,483,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 278 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 113,701,000 | 14,850,000 |
| ශීර්ෂ 279 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 91,933,000 | 18,433,000 |
| ශීර්ෂ 122 | ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 36,868,000 | 9,233,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 51,666,000 | 73,333,000 |
| ශීර්ෂ 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 42,555,000 | 40,050,000 |
| ශීර්ෂ 211 | ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 335,678,000 | 41,666,000 |
| ශීර්ෂ 123 | නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 51,825,000 | 3,182,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 3,134,333,000 |
| ශීර්ෂ 311 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 43,696,000 | 833,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 198,333,000 |
| ශීර්ෂ 124 | සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 77,951,000 | 7,966,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 49,000,000 | 43,433,000 |
| ශීර්ෂ 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 28,259,000 | 7,633,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 67,858,000 | 9,016,000 |
| ශීර්ෂ 125 | නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 35,802,000 | 2,458,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 333,000 | 294,000,000 |
| ශීර්ෂ 126 | අධ්‍යාපන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 111,081,000 | 33,100,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 6,944,295,000 | 1,468,083,000 |
| ශීර්ෂ 212 | විභාග දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 483,416,000 | 21,666,000 |
| ශීර්ෂ 213 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 7,677,000 | 17,100,000 |
| ශීර්ෂ 127 | කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 30,479,000 | 20,933,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 73,469,000 | 20,341,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 221 | කම්කරු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 140,486,000 | 39,633,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 124,082,000 | 62,991,000 |
| ශීර්ෂ 128 | ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 149,443,000 | 12,816,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 44,333,000 |
| ශීර්ෂ 129 | වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 36,954,000 | 4,616,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 494,583,000 | 628,608,000 |
| ශීර්ෂ 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 31,766,000 | 3,433,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 240,933,000 | 105,900,000 |
| ශීර්ෂ 130 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 60,770,000 | 167,900,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 2,624,166,000 |
| ශීර්ෂ 312 | බස්නාහිර පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 640,873,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 745,232,000 |
| ශීර්ෂ 313 | මධ්‍යම පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 4,058,706,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 1,005,921,000 |
| ශීර්ෂ 314 | දකුණු පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 3,432,640,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 717,504,000 |
| ශීර්ෂ 315 | උතුරු පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 2,782,888,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 736,370,000 |
| ශීර්ෂ 316 | වයඹ පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 4,097,966,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 633,229,000 |
| ශීර්ෂ 317 | උතුරු මැද පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 2,090,134,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 665,965,000 |
| ශීර්ෂ 318 | ඌව පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 2,635,548,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 903,325,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 319 | සබරගමුව පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 2,964,273,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 891,176,000 |
| ශීර්ෂ 321 | නැගෙනහිර පළාත් සභාව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 3,296,970,000 | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 1,694,181,000 |
| ශීර්ෂ 132 | ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 48,253,000 | 481,403,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 19,691,000 | 41,900,000 |
| ශීර්ෂ 133 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 48,126,000 | 3,250,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 311,796,000 | 666,803,000 |
| ශීර්ෂ 134 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 36,276,000 | 36,033,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 20,823,000 | 3,758,000 |
| ශීර්ෂ 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 19,361,000 | 16,383,000 |
| ශීර්ෂ 135 | වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 31,597,000 | 5,516,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 485,314,000 | 956,116,000 |
| ශීර්ෂ 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 52,716,000 | 137,116,000 |
| ශීර්ෂ 136 | ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 30,791,000 | 1,853,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 34,406,000 | 49,516,000 |
| ශීර්ෂ 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 25,019,000 | 216,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 88,488,000 | 229,046,000 |
| ශීර්ෂ 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 39,170,000 | 74,183,000 |
| ශීර්ෂ 322 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 45,638,000 | 40,833,000 |
| ශීර්ෂ 138 | දේශීය වෛද්‍ය අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 50,133,000 | 34,283,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | | 34,666,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 60,718,000 | 11,133,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 154,996,000 | 287,281,000 |
| ශීර්ෂ 139 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 42,833,000 | 5,133,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 168,233,000 | 2,137,856,000 |
| ශීර්ෂ 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 75,620,000 | 21,258,000 |
| ශීර්ෂ 291 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 36,863,000 | 64,075,000 |
| ශීර්ෂ 140 | පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 35,250,000 | 8,155,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 4,448,000 | 117,966,000 |
| ශීර්ෂ 292 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 25,766,000 | 7,500,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 68,478,000 | 186,366,000 |
| ශීර්ෂ 142 | සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 42,871,000 | 2,625,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 148,938,000 | 519,858,000 |
| ශීර්ෂ 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 16,010,000 | 673,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 55,815,000 | 36,506,000 |
| ශීර්ෂ 207 | පුරා විද්‍යා දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 11,741,000 | 1,175,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 99,218,000 | 14,233,000 |
| ශීර්ෂ 208 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 5,429,000 | 336,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 23,342,000 | 12,050,000 |
| ශීර්ෂ 209 | ජාතික ලේඛණාරක්ෂණ දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 6,405,000 | 1,625,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 8,689,000 | 26,616,000 |
| ශීර්ෂ 143 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 97,658,000 | 11,516,000 |
| ශීර්ෂ 145 | නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 144,953,000 | 53,766,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 773,340,000 | 794,641,000 |

| ශීර්ෂ අංකය | | | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|---|
| ශීර්ෂ 149 | කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 37,470,000 | 3,933,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 25,913,000 | 296,866,000 |
| ශීර්ෂ 303 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 51,740,000 | 8,141,000 |
| ශීර්ෂ 151 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 25,973,000 | 144,241,000 |
| ශීර්ෂ 152 | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 21,766,000 | 5,115,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 39,456,000 | 2,821,350,000 |
| ශීර්ෂ 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 97,866,000 | 12,583,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 287,551,000 | 765,443,000 |
| ශීර්ෂ 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 36,546,000 | 3,883,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 40,611,000 | 508,490,000 |
| ශීර්ෂ 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 52,508,000 | 101,583,000 |
| ශීර්ෂ 287 | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 23,578,000 | 1,116,000 |
| ශීර්ෂ 288 | මැනුම් දෙපාර්තමේන්තුව | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 46,470,000 | 7,860,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 448,533,000 | 20,050,000 |
| ශීර්ෂ 156 | තරුණ කටයුතු අමාත්‍යවරයා | | | |
| | වැඩසටහන 01 | මෙහෙයුම් වැඩසටහන | 5,973,000 | 833,000 |
| | වැඩසටහන 02 | සංවර්ධන වැඩසටහන | 205,241,000 | 373,191,000 |
